**11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :**

ඉහත විස්තර සඳහන් ........................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ .............. ..................................................... තනතුරක සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදිවන බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත් මෙයින් සහතික කරමි.

.........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

08-326

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

***රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට සීමිත ධාරාව යටතේ බඳවාගැනීමේ තරග විභාගය - 2025***

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 03 ක් සීමිත ධාරාව යටතේ පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් 2024.03.17 දිනට සක්‍රීය සේවයේ නියුතුව සිටින නිලධාරීන්ගෙන් පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ wwwdoenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 සැප්තැම්බර් මස 01 වැනි දින පෙ.ව. 9.00** ට විවෘත වන අතර **2025 සැප්තැම්බර් මස 26 වැනි දින රාත්‍රී 9.00**ට අවසන්වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙ හි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

**1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත, එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වඩා ලකුණු ලබාගන්නා අපේක්ෂකයින්ගේ වැඩිම ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය

සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

තව ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 අනුව, කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේ දී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබාගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරාගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්තය.

I. අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
II. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය පරිදි පත්වීම් ලිපි නිකුත් කරනු ලබන දිනය හෝ ඊට පසු දිනයක් වනු ඇත.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
III. අංක 18/2020 හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙ හි හා අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතුය.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කර ඇති අංක PSC/EST/2/1/25/1/4/2011 හා 2013.10.22 දිනැති රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පටිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.
V. රෙජිස්ට්‍රාර් සේවයේ I පන්තියේ III ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර බඳවාගැනීමේ පටිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
VI. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**3. වැටුප් පරිමාණය**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය

රු.82,150–10x2,400–8x2,940–17x3,900–රු. 195,970/- (SL-1-2025)

**4. සුදුසුකම් :**

**4.1 අධ්‍යාපන සුදුසුකම් :** අදාළ නොවේ.

**4.2 පළපුරුද්ද** :

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ ස්ථිර කර තිබීම.
(ආ) රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ අවුරුදු 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 සහ එහි සංශෝධනයන් හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**4.3 කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙ හි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

4.4 *වෙනත් සුදුසුකම්* :

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට, බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් කර ඇති සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4.5 *වයස් සීමාව* : අදාළ නොවේ.

05. ලිඛිත විභාගය :

5.1 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

5.2 විභාගය භාෂා ත්‍රිත්වයෙන් ම පවත්වනු ලැබේ. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

5.3 ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ. :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම | පැය 03 | 100 | 40% |
| විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම | පැය 03 | 100 | 40% |

5.4 විභාගය සඳහා අදාළවන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම | (අ) ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පනවන ලද නියෝග<br>(ආ) ලේඛන ලියාපදිංචි කිරීම හා හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් විටින් විට නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් |
| විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම | (අ) විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පනවන ලද නියෝග<br>(ආ) විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් විටින් විට නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් |

**6. විභාග කොන්දේසි :**

6.1 අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයින් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලට ම පෙනී සිටිය යුතුය.

6.2 විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය. :

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions),
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon),
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

6.3 මෙම විභාගය **2025 නොවැම්බර් මස කොළඹ දී** පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

6.4 අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* : ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

6.5 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

6.6 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

6.7 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත්, තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුවකුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

6.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

6.9 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති වරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :

I. ජාතික හැඳුනුම්පත,

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,

III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

6.10 එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**සැලකිය යුතුය :**

(අ) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවක දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ආ) විභාග ප්‍රවේශ පත්‍රය අයදුම්කරුගේ නමින් අයදුම්කරුගේ කාර්යාලයීය ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ.

(ඇ) පත්වීම සඳහා සුදුසුකම් ලබන යම් අයදුම්කරුවකු එම පත්වීම පිරිනමන අවස්ථාවේ දී බලපවත්වන රෙගුලාසි හා විධිවිධාන යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ, හැසිරීම කරණ කොටගෙන හෝ මෙම පත්වීම නොදීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**7. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

❖ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීම ද මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

8. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ජූලි මස 31 වැනි දින.

08-325

# Examinations, Results of Examinations & c.

## PUBLIC SERVICE COMMISSION

### Ministry of Public Administration, Provincial Councils and Local Authorities
### Registrar General's Department

RECRUITMENT TO GRADE III OF CLASS I OF THE REGISTRAR SERVICE OF THE REGISTRAR GENERAL'S DEPARTMENT UNDER LIMITED SCHEME-2025

APPLICATIONS are called, on the direction of the Public Service Commission, from the Officers who are in the active service as at 17.03.2024 with the following qualifications to fill 03 vacancies existing in Class I of Grade III of the Registrar Service of the Registrar General's Department, under Limited Scheme.

The application for this purpose is published in the website www.doenets.lk of the Department of Examinations, Sri Lanka through "Online Applications-Recruitment Exams/E.B.Exams" under "Our Service" and the applications can strictly be submitted online. Accepting online applications will be commenced on **01st of September 2025 at 9.00 a.m. and end on 26th of September 2025 at 9.00 p.m.** After submitting the application online method, it should be downloaded and the relevant parts of the printed copy should be filled in hand writing and should be sent to reach to the Sri Lanka Department of Examinations, by registered post on or before the closing date of the applications with the certification of the head of the department certifying the signature of the applicant.

Officers should handed over a copy of the application to the head of the department to include into attach their own personal file and, at the calling for the interview, a copy of the application which is certified by the head of the department and a letter of confirmation in the service should be submitted.

**1. Method of Recruitment**

Based on the results of the written examination, candidates who secure 40% or more marks for each question paper will be recruited on the order of marks. The qualifications of the candidates will be verified by a Board of Interview approved by the Public Service Commission. Marks will not be awarded for the interview.

Further, according to the Circular No.01/2024 of Public Service Commission, When filling vacancies in the order of merit, if, at any point, the number of candidates with equal marks exceeds the remaining number of vacancies, Public Service Commission may decide to make further selection from those candidates who have secured equal marks, if there is a current requirement to fill the vacancies. This selection process is composed of the following :

I. A written test to assess the ability of the candidates
II. Merit based interview.

The effective date of the appointment will be the date of issue of appointment letters or a later date as decided by the Public Service Commission.

**2. Conditions of deploying in the Service and Service Conditions:**

I. This post is permanent and pensionable. Contribution should be made to the widows' and orphans' Pension Scheme.

II. The Officers appointed for this post is subject to a probation period of one year.

III. In accordance with the provisions of Public Administrative Circulars 18 /2020 and dated 16.10.2020, and circulars thereof, language proficiency of prescribed other official language/languages should be obtained.

IV. This appointment will be subject to the conditions, orders No. PSC/EST/2/1/25/1/4/2011, approved by the Public Service Commission and the orders and conditions in the service minutes of the executive service of the Registrar General's Department dated 22.10.2013, the amendments that have already been made or could be made

in future to the same service minute, general orders and conditions governing the appointments of the public service, Procedural Rules of the Public Service Commission, provisions of the Establishments Code and Financial Regulations of the Democratic Socialist Republic of Sri Lanka, and also to other departmental conditions, orders.

V. Should pass the First Efficiency Bar examination in accordance with the service minute within three years (03) from appointing of Grade III of Class I of the Registrar Service.

VI. It is not allowed to change the language medium applied later and the language medium eligible for your appointment is the language mentioned in the application by you.

**3. Salary Scale :-**

This post is entitled to the monthly salary scale of Rs. 82,150-10x2,400-8x2,940-17x3,900-195,970/ (SL-1-2025) as per the provisions of the Public Administration circular No.10/2025 and dated 25.03.2025.

**4. Qualifications :-**

**4.1 Educational Qualifications :-**

Not applicable

**4.2 Experience :-**

(a) Permanent appointment in Grade II of the Registrars Service of the Registrar General's Department.
(b) Having completed a satisfactory period of 03 years of service in Grade II of the Registrar Service
(c) Should not have any disciplinary punishment in accordance with the provisions mentioned in Public Service Commission Circular No.01/2020 and amendments therein

4.3 **Physical Suitability :-**

Every candidate should be physically and mentally sound enough to serve in any part of the Island, perform duties of the post.

4.4 **Other Qualifications :-**

- Applicants should be a citizen of Sri Lanka,
- Applicants must have an excellent moral character,
- Should have fulfilled all the necessary qualifications required to recruit to the post by the closing date of the applications.

4.5 **Age Limit :-**

Not applicable

**5. Written Examination :-**

5.1 Candidates are subjected to the rules and regulations imposed by the Commissioner General of Examinations on conducting the examination and issuing the results. He or she shall be liable to be subjected to a punishment imposed by the Commissioner General of Examinations in case of violation of these rule and regulation.

5.2 Examination shall be conducted in all three languages. Candidates will not be allowed to change the medium of examination produced by them in the application form.

5.3 Written examination consists of the following question papers :-

| *Question Paper* | *Duration* | *Total Marks* | *Pass Marks* |
|---|---|---|---|
| Document Registration and Title Registration | 03 hours | 100 | 40% |
| Registration of Marriage, birth and death certificates | 03 hours | 100 | 40% |

5.4 Syllabus related to the written examination

| *Name of the Question paper* | *Curriculum* |
|---|---|
| Registration of documents and registration of titles | (a) Orders imposed by the Registrar General on registration of documents and registration of titles<br>(b) Circulars and instructions issued time to time by the Registrar General on registration of documents and registration of titles |
| Registration of marriages, births and deaths | (a) Orders imposed by the Registrar General on registration of marriages, births and deaths.<br>(b) Circulars and instructions issued time to time by the Registrar General on registration of marriages, births and deaths. |

**6. Examination Conditions:**

6.1 Candidates can sit the examination in any one of languages of their choice. Candidates should answer all question papers in the same language. Candidates will not be allowed to change the medium of examination produced by them in the application form. Every candidate should answer all question papers.

6.2 Fee for this examination is Rs. 1200/=. Payment of examination fees should be made strictly using the following methods provided by the online system.

I. Through any Bank Credit Card,
II. Any Bank Debit Card with the facility of internet transaction,
III. Online Banking method of bank of Ceylon,
IV. Any Branch of the bank of Ceylon.

*Note:*

(a) The instructions on payment through the above methods are published under the technical instructions related to the examination in the website

(b) The receipt of payment shall be acknowledged through SMS or e-mail. The total/ full amount due examination fee should be paid and applications of the candidates, who have made payments more or less than the prescribed examination fee, will be rejected. Department of Examinations shall not bear responsibility on the errors that occur when paying the examination fees through the above methods.

(c) Under no circumstances the examination fee shall be refunded or allowed to be transferred in favour of another examination.

6.3 This examination will be held in Colombo in the month of November 2025. The date of the examination will be notified later.

6.4 Uncompleted applications shall be rejected without notice.

*Note:* No candidate is allowed to enter the examination hall without the admission card. Only an admission card in which the signature of the candidate is attested should be presented to the supervisor on the date of commencement of the examination.

6.5 The issuance of an admission card to a candidate shall not be considered as an acceptance that he/ she have fulfilled the qualifications to sit for the examination or for a post.

6.6 Online applications should be filled in English medium only. The candidates will be notified that the soft copy submitted online is accepted/not accepted as a valid application by the department through SMS sent to the mobile number used to access the system or by an e-mail sent to the e-mail address. Download the common instructions sheet prepared for applying for the examination before filling the online application. Strictly follow these instructions when filling the application. Any amendment made in the application after taking a printed copy of the application

will not be considered as a valid amendment. Incompleted applications shall be rejected without notice. Applications received after the closing date will not be accepted.

6.7 The Commissioner General of Examinations shall issue admission cards to the applicants, who are within the age limit prescribed in the notification and have paid the prescribed examination fees and submitted the duly completed applications online on or before the closing date of applications, on the presumption that only those who have the qualifications mentioned in the examination notice have applied. Immediately after the issuance of admission cards to the candidates, a notice thereon will be published in the official website of the Department of Examinations. If the admission card is not received within 02 or 03 days of publishing the notice, steps shall be taken to notify the Institutional Examination Organization Branch of the Department of Examinations in the manner specified in the advertisement. The name of the examination, full name and address of the applicant should be clearly mentioned when making an inquiry in the said manner. It would be more effective to send a letter of request to the fax number mentioned in the notification furnishing a fax number to which a copy of the admission card can be obtained without delay in case of applicants outside Colombo. It would be advisable to keep the following in hand to prove any matter inquired by the Department of Examinations: *i.e.* A printed copy of the application and the receipt obtained by paying the examination fee kept at your possession.

6.8 With the approval of the Public Service Commission, the Commissioner General of Examinations has the power to either postpone or cancel the examination.

6.9 All candidates should prove their identity to the satisfaction of the supervisor of the examination hall for each paper they sit. Any of the following documents shall be accepted for this purpose.

I. The National Identity Card,
II. A valid Passport,
III. A valid Sri Lankan Driving License.

6.10 Moreover, all candidates should enter the examination hall without covering their face and both ears, so that the examination staff may easily verify their identity. Any candidate refusing to prove the identity is not allowed to enter the examination hall. Further, once entered the examination hall, all candidates should keep their face and both ears open until leaving the hall, so that the examination staff may verify their identity.

Should be considered:

(a) The applications of the applicants who are unable to submit the relevant documents in an instance of informing to submit the documents will not be considered.
(b) Admission will be sent to the official address of the applicant in the name of the applicant by registered post.
(c) If such applicant who is eligible for the appointment will be considered as non-eligible at the instance of awarding of the appointment under the regulations and provisions authorized, or subject to the unsatisfied work, behavior or the power of non-awarding of the appointment is with the Public Service Commission.

**7. Furnishing False Information**

If such information mentioned in the application furnished by you is found to be false or incorrect before the selection, your candidature or selection is liable to be cancelled.

If such information is found to be false or incorrect after selection, action may be taken for the person in question to be dismissed from service.

- The final decision on any matter that does not include in this notice rests with the Public Service Commission. The power of taking final decision for filling vacancies or non-filing or filling part of the vacancies is with the Public Service Commission.

**8.** In case of any discrepancy arises among the phrases of this notice, which is published in Sinhala, Tamil and English languages, the Sinhala notice will be considered as the correct one.

As per the order of the Public Service Commission,

S. Alokabandara,
The Secretary.

Ministry of Public Administration,
Provincial Councils and Local Government.
On 31st day of month July, 2025.

08-325

---

## MINISTRY OF JUSTICE AND NATIONAL INTEGRATION

### Department of Prisons

OPEN COMPETITIVE EXAMINATION FOR THE RECRUITMENT OF PRISON GUARD - 2025

APPLICATIONS are called from qualified Sri Lankan citizens for the Open Competitive Examination to Recruitment for vacant positions of Prison Guard (Female/Male) in the Department of Prisons- Sri Lanka.

- This examination is to recruit for the Post of Prison Guard under Police and Other Regulatory Services in the Department of Prisons-Sri Lanka

**Note: Applicants who pass the written examination will have to appear for a physical fitness test as stated in sub-sections (1), (2), and (3) of Clause 12 of this notice and a suitability assessment interview. Therefore, only applicants with qualifications mentioned in those clauses are expected to apply.**

**02. Examination Date and Conducting Examination:**

This examination will be held in November, 2025 in main cities across the island mentioned in Schedule - 1. The city you wish to appear for the examination must be clearly indicated with its number from the provided schedule. You will not be allowed to change the city later. However, if there are not enough applicants to set up an examination center in a particular city, applicants will be directed to a center established in the city mentioned as their second choice on the application or a nearby city. If there are not enough applicants to establish examination centers in all or most of the proposed cities, the Commissioner General of Examinations will arrange the examination to be held only in Colombo.

**Schedule - 1**

| **Schedule No. 05** | |
|---|---|
| Colombo | 01 |
| Kandy | 02 |
| Galle | 03 |
| Jaffna | 04 |
| Batticaloa, | 05 |
| Kurunegala | 06 |
| Anuradhapura | 07 |
| Badulla | 08 |
| Rathnapura | 09 |